පරිසර සම්පත් පැතිකඩ

අංක 589 දියගම නැගෙනහිර

පටුන

වසමේ මූලික තොරතුරු	4
වසම හා අංකය	4
වපසරිය (km^2 හා අක්කර හා හෙක්ටයාර්)	4
ප්‍රා.ලේ. කොට්ඨාසය	4
ගොවිජන හා කෘ.ප.නි.ස. කොට්ඨාසය	4
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය	4
පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාසය	4
බීට්ටු වන කාර්යාල කොට්ඨාසය	4
අඩවි වන කාර්යාල කොට්ඨාසය	4
වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය	4
ජනගහණය	4
ජනාවාසකරණයේ ස්වභාවය	4
දේශගුණික තොරතුරු	4
පාංශු තොරතුරු	4
පරිසර සම්පත් පැතිකඩක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව	5
ස්වභාවික සම්පත් පැතිකඩ	5
භෞමික සම්පත්	5
ජල සම්පත්	6
වනාන්තර හා වනවගාවන්	9
වන වැස්මේ වපසරිය	9
සුලබ ශාක පිළිබඳ ලේඛනය	9
දැවමය නොවන නිෂ්පාදන	9
වන විනාශකිරීම් පිළිබඳ විස්තරය	9
වනවගා ව්‍යාපෘති විස්තරය	10
වන සංරක්ෂණ ප්‍රයත්නයන්	10
ජෛව විවිධත්වය	10
ශාක ලේඛනය	10

ශාක වර්ගීකරණය (දේශිය/විදේශීය/ආක්‍රමණික)	11
අන්තරායට ලක්වූ කාණ්ඩ	12
පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්	12
කෘෂිකර්මය	13
පශු සම්පත් කර්මාන්ත	15
ධීවර කර්මාන්තය	15
ශක්ති ප්‍රභව	15-16
සමාජ සංස්කෘතික සන්දර්භය	16
පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරන යාන්ත්‍රණය	17
සම්ප්‍රදායික පරිසර දැනුම හා පරිචාර	17
ජනප්‍රවාද	17
ජනශ්‍රැතිය	17
දේශීය වෛද්‍ය ක්‍රම	17
සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිචාරණය	18
පරිසර ගැටළු සඳහා යෙදුනු විසඳුම්/විකල්ප	18
කාලීන පාරිසරික අර්බුධ හා අභියෝග	18
පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කර ගැනීම	20
තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමණාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස් යෝජනා හා නිර්දේශ	22-23
විමර්ශන	
වසම පිළිබඳ	24

1. හැඳින්වීම

  i. වසමේ මූලික තොරතුරු

   (a) වසම හා අංකය - 589 දියගම නැගෙනහිර

   (b) වපසරිය (හෙක්ටයාර් 147)

   (c) ප්‍රා ලේ කොට්ඨාසය - හෝමාගම

   (d) ගොවිජන හා කෘෂිකර්ම කොට්ඨාසය - කහතුඩුව, දියගම

   (e) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය - කහතුඩුව

   (f) පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාසය - හෝමාගම

   (g) බීට්ටු වන කාර්යාල කොට්ඨාසය - කළුතර

   (h) අඩවි වන කාර්යාල කොට්ඨාසය - වග

   (i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය - කොළඹ

  ii. ජනගහණය (විමර්ශන හා උපුටාගැනීම් දැක්විය යුතුය) - 2136

  iii. ජනාවාසකරණයේ ස්වභාවය (ග්‍රාමීය/නාගරික/අර්ධනාගරික/වතු...) - ග්‍රාමීය

  iv. දේශගුණික තොරතුරු

(a)	අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම	-	අක්ෂාංශ 6.9122 දේශාංශ 79.9687
(b)	උෂ්ණත්වය (සාමාන්‍ය/උපරිම/අවම)	-	31^0C
	අවම	-	27^0C
(c)	වර්ෂාපතනය (mm)	-	390mm
(d)	සාපේක්ෂ ආර්ද්‍රතාව	-	72%

  v) පාංශු තොරතුරු

(a)	පසේ ස්වභාවය	-	සියුම් වයනය
(b)	පසේ වර්ගය	-	රෙඩ් යෙලෝ පොඩ්සොලික්
(c)	සුලබ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය)		

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාව

  i. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම

  ii. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම

  iii. පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම

  iv. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම

  v. සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම

  vi. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කරගැනීම

  vii. අඛණ්ඩ මෙහෙයුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම ස්ථාපිත කිරීම

3. ස්වභාවික සම්පත් පැතිකඩ

i. **භෞමික සම්පත්**

(a) වපසරිය/භූමි ප්‍රමාණය

1.47 km^2

හෙක්ටයාර් 147

(b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය

i. වී වගා කරන හෙක්ටයාර් 28.8 (කෘෂි නිලධාරි)

පුරන් කුඹුරු හෙක්ටයාර් 3.23

ii. වෙනත් ධාන්‍ය බෝග (ඉරිඟු/මුං/කවුපි ආදිය) - අදාල නොවේ

iii. අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)

iv. භූමි යෙදවුම

1. ගොඩ ඉඩම් - හෙක්ටයාර් 147
2. මඩ ඉඩම් (ශ්‍රේණිය සහිතව) - හෙක්ටයාර් 28.8

වගා කරන W ශ්‍රේණියට අයත් වේ.

මුළු මඩ ඉඩම් - අක්කර 80

3. පුරන් වූ - අක්කර 8 කැබලි 18

අත්හැර දැමූ - අක්කර 8, හෙක්ටයාර් 3.25

(c) පසේ ස්වභාවය හා සාඵල්‍යතාව - පස යනු පාෂාණය මත දීර්ඝ කාලයක් සිදුවන භෞතික රසායනික ඓන්ද්‍රිය ක්‍රියාවලීන්ගේ අවසානයේ ස්ථිර ලක්ෂණ පෙන්වමින් සකස් වූ තුනී ස්ථරයයි. බලපෑමට ලක්ව ඇති ප්‍රධාන අංගයක් වන්නේ පසයි.

දියගම නැගෙනහිර වසමෙහි පසේ ස්වභාවය හා සාඵල්‍යතාවය ගැන කතා කිරීමේදී කුඹුරු ආශ්‍රිතව මඩ මිශ්‍ර වැලි පසක් දැකගත හැකි අතර මතුපිට පස රතු කහ පෝඩ් සොලික් වර්ගයට අයත් වේ. වගාවන් සඳහා මේ වන විටත් රසායනික පොහොර වර්ග භාවිත වීම හේතු කොට ගෙන ගුණාත්මක භාවය අඩු වෙමින් පවතී. කුණු කැලි කසළ හේතුකොට ගෙන පාරිසරික වශයෙන් දූෂණයට ලක් වෙමින් පැවතීම ප්‍රධාන ගැටලුවක්ව පවතී.

(d) පාංශු ඛාදනයේ ස්වභාවය - යම් ස්ථානයක පිහිටි පසේ කොටස් බාහිර කාරකයක උපකාරයෙන් පාංශු දේහයන් හෝ පාංශු සමූහයෙන් වෙන් වී පිහිටි ස්ථානයේ සිට වෙනත් ස්ථානයක් කරා පරිවහනය වී තැන්පත් වීම පාංශු ඛාදනය වේ. පාංශු ඛාදනය ආකාර දෙකකින් යුක්ත වේ. ජලය හා සුළඟ මඟින්, කෙටි කාලයකදී මිනිස් ක්‍රියාවන් නිසා පසේ සාරවත් බව නැතිවීම. දියගම නැගෙනහිර වසම ගැන සඳහන් කිරීමේදී පාංශු ඛාදනයේ ස්වභාවයන් යම් ප්‍රමාණයක් දක්නට ඇත. ඇල ඉවුරු දෙපස ඛාදනයට ලක්වී ඇත. පස් සෝදා ගෙන ගොස් ඇත. ඇළ දෙපස පළල් වී ඇත. තද වර්ෂා කාල වලදී කුඹුරුත් ජලයෙන් යටවන නිසාත් මද වශයෙන් පාංශු ඛාදනයට ලක්වේ.

(e) පාංශු හායනයේ ස්වභාවය - ස්වභාවික හෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පස් ඉවත්වීම හෝ බාදනය වීමේ ක්‍රියාවලියයි. විශේෂයෙන්ම සුළං වර්ෂාව හෝ වෙනත් පාරිසරික සාධක මගින් පස් ඉවත්වීම මෙයට ඇතුළත් වේ. පාංශු හායනය මද වශයෙන් දියගම නැගෙනහිර වසමේ දක්නට ලැබේ. බොහෝ විට පොහොර භාවිතය රසායනික පොහොර යෙදීම හේතුවෙන්ද සරු පස නැති වීමට හේතු වී ඇත. පසේ පෝෂක ප්‍රමාණය අඩුවීමද පාංශු හායනයට බලපායි.

ii. **ජලජ සම්පත්**

(a) **මතුපිට ජල මූලාශ්‍ර**

දියගම ඇල

දියගම ගමට අයත් වන ග්‍රාම නිලධාරී වසම් දෙකම සම්පූර්ණ වශයෙන්ම බොල්ගොඩ ජලාශයේ ශාඛාවක් වන දියගම ඇලෙන් වට වී ඇත. මෙම දියගම ඇළ මාවත්ගම ප්‍රදේශයෙන් ආරම්භ වී තෝරමුල්ල ප්‍රදේශයෙන් දියගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් ගලේ අමුණ ඔස්සේ ගමට ඇතුළු වී වන ලැහැබ් හා රබර් වතු මැදින් 3/4 km පමණ ගලා විත් දියගම වීර මැගිලින් අමුණ ඔස්සේ තවදුරටත් සුන්දර පාල කෙත යාය සහ කිරිවත්තුඩුව ගමට මායිම්ව ගලා බසී. 2km පමණ ගලා බසින මෙම ඇල අනතුරුව කල එළි ඕවිට අමුණ ඔස්සේ පහළට වැටී තවත් 3km පමණ ගම වටා ගලා බැස දීපංගොඩ ඔස්සේ ගලා බසින ඇලට කහතුඩුව ප්රදේශයෙන් එක්වී බොල්ගොඩ ගඟ බලා පහළට ගලා බසී.

දිය වලවල්

දියගම බටහිර ග්‍රාම නිලධාරී වසමට අයත් කඳවල වල සහ දියගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් හීතවල දිය උල්පත්වලින් පිරුණු දිය වලවල් වේ.

1. කඳවලවල

ඉතා ඈත අතීතයේදී බැමිණිටියා සාය නම් ඉතා තද නියං සමයකදී බ්‍රාහ්මණගම විසූ බ්‍රාහ්මණයින් හට දිය ගෙන ගොස් ඇත්තේ මෙම කඳවල වලෙනි. එම නිසා මෙම ගමට දියගම යැයි මෙම නම වැටුණු බව ජනප්‍රවාදයේ එයි.

කෙතරම් තදින්ම නියං සමයකදී වුවත් මෙම වලෙහි දිය නොසිඳීම විශේෂත්වයකි. එසේම මෙම දියවල අඩි 20 ක් පමණ ගැඹුරු දිය වළක් බව ගැමියෝ පවසති. අතීතයේදී බීමට, ගම්මානය, මැදගම්මානය සහ කුරුඳුවත්ත ප්‍රදේශවාසීන්ගේ බීම, නෑම සහ කෘෂිකාර්මික කටයුතු වැනි සියලු ජල අවශ්‍යතා සපුරාගෙන ඇත්තේ පිහිනුම් තටාංගණයක් වැනි මෙම දියවලෙනි. එසේ වුවත් අද වන විට මෙම දියවල සම්පූර්ණයෙන්ම අතහැර දමා ඇත.

2. හීත වල

දියගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් වීර මැගිලින් අමුණ ආසන්නයේ පිහිටා තිබූ මෙම වල ද අතීතයේ තෝරමුල්ල, දියගල්ල, පිංහේන ප්‍රදේශවල ජීවත් වූ ගැමියන්ගේ සියලුම ජල අවශ්‍යතා සපුරාලු මේ සුන්දර දිය වල අද වන විට

සම්පූර්ණයෙන්ම ගොඩ කර ඇත. මෙම දියවලේ ඇති ජලය තද සීතලකින් යුතු බැවින් මෙම වල සීත වල යැයි නම් ලැබී ඇති බව ජනප්‍රවාදයේ පවතී.

කෙසේ වුවත් මෙම දිය වලවල් පිළිබඳ පාරිසරික සහා ඓතිහාසික වටිනාකම් පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර නොමැති අතර එවැනි අධ්‍යයනයකින් පසුව මෙම පරිසර පද්ධති පිළිබඳව වටිනා තොරතුරු රැසක් අනාවරණය කර කරගත හැක.

දිය උල්පත්

දැනට දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයට යාබදව පිහිටා ඇති දියගම වනාන්තරය තුළ දිය උල්පත් පිරුණු ජලාශ දෙකක් දක්නට ඇත.

එසේම අතීතයේදී මේ ගමේ සෑම ගෙවත්තකම කිසිදා දියනොසිඳෙන නාන පොකුණු තිබී ඇති අතර වර්තමානයේ දී ද මින් සමහරක් දැකිය හැක.

(b) භූගත ජලය

- ළිං - 421 (සම්පත් පැතිකඩ)
- නළ ළිං - අදාල නොවේ

(c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යන්‍ය වර්ෂාපතනය 280 mm

6. වසමේ සාමාන්‍යය කාලගුණික සහ දේශගුණික තත්ත්වය

සංරචකය	ජන:	පෙබ:	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්:	ඔක්:	නොවැ	දෙසැ:
වර්ෂාව	50	40	150	200	220	300	350	320	270	150	200	100
උෂ්ණත්වය	23 32	24 33	23 31	24 30	23 30	24 29	23 28	23 30	24 29	23 30	24 30	24 30

- වර්ෂා ක්‍රමය (මෝසම්/සංවහන) - සංවහන සහ නිරිත දිග මෝසම්

(d) වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර - අදාල නැත
- සුළු වාරි ව්‍යාපාර

වාරිමාර්ග කටයුතු

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නඩත්තු වන සුළු වාරි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. දියගම ඇල ආශ්‍රිතව ගලේ අමුණ, වීර මැගිලින් අමුණ සහ පහළ අමුණ ලෙස අමුණු තුනක් ක්‍රියාත්මක වෙයි.

1. ගලේ අමුණ

මාවත්ගම සහ කිරිවත්තුඩුව කොස්වත්ත දෙස සිට දෙපසකින් ගලා එන ජලය ගලේ අමුණ ඔස්සේ දියගම ගමට ඇතුල් වෙයි. මෙම අමුණ පිහිටි කලුගල මත වාන් දොරටු හතරකින් නිර්මිතය. ඉංග්‍රීසි පාලන සමයෙහි සුදු ජාතික වාරි ඉංජිනේරුවරයෙක් ගුවනේ සිට නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මෙම ස්ථානයේ අමුණ ඉදිකිරීමට උපදෙස් දී ඇති බව ජනප්‍රවාදයේ සඳහන්ය.

2. වීර මැගිලින් අමුණ

ගලේ අමුණට 1 ½ km පමණ පහලින් වීර මැගිලින් අමුණ ඉදිකර ඇත. අතීතයේ දී තෝරමුල්ල සහ මූණමලේ සිට දියගම බාලිකා විද්‍යාලයට (අද දියගම කණිෂ්ඨ විද්‍යාලය ලෙස හැඳින්වෙන පාසල) පැමිණෙන දරුවන් මෙම ඇල හරහා දමා තිබූ ඒ දණ්ඩෙන් එගොඩ වී පාසලට පැමිණෙයි. එක් දිනක මෙසේ ඒ දණ්ඩෙන් එගොඩ වන විටක එක් දැරියක් පස ලිස්සා ගොස් ඇලට වැටී ඇති අතර, එම අවස්ථාවේ ඔවුන් අතර සිටි මැගිලින් නම් දැරිය වහා ක්‍රියාත්මක වී ඇලට පැන එම දැරියගේ දිවි බේරා ගත් බවත් මේ පුවත සැලවුණු කිරිවත්තුඩුව ප්‍රදේශයේ සිටි පුවත්පත් වාර්තා කරුවෙකු මෙතැන පාලමක් ඉදිකිරීමට මෙය කදිම අවස්ථාවකැයි සිතා මෙම සිදුවීම අලලා පුවත්පතට වාර්ථාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කෙරිණි. එවකට අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මෙම ස්ථානයේ අමුණක් සෑදීමටත් මෙම මැගිලින් දැරියට කොළඹ විශාකා විද්‍යාලයේ නේවාසික අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යත්වයක් පිරිනැමීමටත් පියවර ගන්නා ලදී. ඉන්පසු මෙම මැගිලින් දැරිය ''වීර මැගිලින්'' ලෙස සම්මානනීයත්වයට පත් වූ අතර, 1969 යූරි ගගාරින් මහතා ලංකාවට පැමිණි අවස්ථාවේ මල් මාලයක් දමා පිළිගනු ලැබුයේ ද මෙම වීර මැගිලින් බව ජනප්‍රවාදයේ සහ පුවත්පත් වාර්තාවල සඳහන් වෙයි. මෙම අමුණ වීර මැගිලින් අමුණ ලෙස හැඳින්වෙන්නේ මේ අනුවයි.

(e) ජලයේ ගුණාත්මක බව

2023 ජාතික විද්‍යා පදනමේ අනුග්‍රාහකත්වය යටතේ A.M.U.M අබේසිංහ විසින් කරන ලද "Cyprinidae family fish diversity in Diyagama Ela - South West Ethylogical Zone" අධ්‍යයනයට අනුව දියගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම සහ බටහිර වසමට අයත් 1km පමණ ප්‍රදේශයේ ජලය දූෂණයට ලක්වෙමින් පවතී.

අතීතයේ දී මෙම ප්‍රදේශයේ ජලය ඉතා ඉහල ගුණාත්මක බවකින් යුතුව පැවැති අතර විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අද වන විට ජලයේ ගුණාත්මක බව පිරිහෙමින් පැවතීම විශාල පාරිසරික ගැටලුවක්ව පවතී.

iii. වනාන්තර හා වනවගාවන්

(a) වන වැස්මේ ව්‍යාප්තිය (අක්කර 25)

දියගම වනාන්තරය

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාක සහ සත්ව විද්‍යා අධ්‍යනාංශයේ පර්යේෂණ වාර්තා කිහිපයකටත්, නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනයේ ඖෂධීය ශාක පිළිබඳව කරන ලද අධ්‍යයනයන්ට අනුවත්, දියගම බටහිර ග්‍රාමසේවා වසමට අයත් දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය පිහිටි භූමිය තුළ පිහිටා ඇති දියගම වනාන්තරය ඉතා ඉහළ ජෛව විවිධත්වයකට උරුමකම් කියන පාරිසරික සෞන්දර්යාත්මක සහ ඖෂධීය වටිනාකම් රැසක් සහිත ශාක සිය ගනනකින් සමන්විත වනාන්තරයකි.

2025-04-25 දින සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකළ ක්ෂේත්‍ර නිරීක්ෂණ අනුව මෙය සංරක්ෂණය කළ යුතු තෙත් කලාපීය වැසි වනාන්තරයක් ලෙස ද හඳුනාගෙන තිබේ.

දැනට හෝමාගම ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින ක්‍රීඩා අමාත්‍යංශයට පැවරීමට නියමිතව ඇති රජය සතු අක්කර 25 ක් පමණ වන වැස්මකින් යුතු ද්විතියික මට්ටමේ වනාන්තරයකි.

(b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

පොල්	කොස්	අඹ	රඹුටන්	කෙසෙල්	දෙල්	ග්ලිසරීඩියා
650	88	50	25	700	15	2500

(c) දැවමය නොවන වන නිෂ්පාදන (NTFP)

- ආහාර සහ ආකලන - ගම්මිරිස්, කහ, ඉඟුරු
- දේශීය ඖෂධ - කෝමාරිකා, අක්කපාන, පාවට්ටා, නිල්කටරොලු, හීං ඇඹුල් ඇඹිලිය, ඉරමුසු, මොණර කුඩුම්බිය, වැල්පෙනෙල, තිප්පිලි, එඬරු.
- ශාකසාර - නැත
- අත්කම් අමුද්‍රව්‍ය - උණ
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය - පොල්, පුවක්, කොස්, අඹ
- සැරසිලි හා සංස්කෘතික වටිනාකමක් සහිත ද්‍රව්‍ය - පිහිඹියා, ඇකේෂියා, ක්‍රෝටන්

(d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය

දියගම වනාන්තරය ද ඇතුළුව අක්කර 126 ක් වූ සම්පූර්ණ භූමිය ගුවන්විදුලි සංස්ථාව සතුව තිබී පසුව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා එම භූමියේ කොටසක් එළි කරනු ලදුව ඇත. ඊට අමතරව තවත් භූමි කොටසක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව කෘෂි උද්‍යානයක් පවත්වාගෙන යමින් පවතී.

මේ අනුව උක්ත වනාන්තරය සහිත මෙම අක්කර 26 ක පමණ භූමි කොටස ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ක්‍රීඩා විද්‍යාලයක් ඉදිකිරීම සඳහා මේ වන විට සංවර්ධන සැලසුම් සකස් කර ඇත. ඒ අනුව මෙම අක්කර 26 ක් පමණ වන වන වැස්ම නුදුරු අනාගතයේදී එළි පෙහෙළි කිරීමට නියමිතය.

හෝමාගම නගරයට ඉතා ආසන්නව පිහිටා ඇති මෙම අවශේෂ වනාන්තරය ආරක්ෂා කර ගැනීම ඉතාමත් වැදගත් කර්තව්‍යයක් වන්නේ එය ශාක හා සත්ව ප්‍රජාවට නිවහනක් සපයමින් ජෛව විවිධත්වය හා සමතුලිතතාව පවත්වා ගෙන යන නිසාම පමණක් නොවේ. නාගරීකරණයට ලක් වූ කොළඹ වැනි නාගරික කලාපයට තදාසන්නව පවතින වනාන්තර කලාපයක් බැවින් පරිවාර ප්‍රදේශවල වායු දූෂණය පාලනය කරමින් ඔක්සිජන් සංචිතය නියාමනයට ලබාදෙන දායකත්වය මෙන්ම වායු ගෝලීය උණුසුම් යාමනයට කරනු ලබන අමිල මෙහෙවර, ජලපෝෂක කලාපයක් ලෙස විද්‍යාර්ථයින් සඳහා අධ්‍යයන කලාපයක් හා සංචාරක කලාපයක් වශයෙන්, බොල්ගොඩ ගඟෙහි ජල පෝෂක ප්‍රදේශයක් ලෙස ගංවතුර පාලන කාරකයක් ලෙස ද වශයෙන් මේ සා විශාල කාර්යභාරයක් ඉටුකරන ස්ථානයක් ද වන බැවිනි.

එසේම වනාන්තරයට යාබදව පවත්නා වැසි ජලයෙන් හා වනාන්තරයෙන් ගලනා දිය පහර වලින් සාර්ථකව වගා කටයුතු සිදු කරන කුඹුරු යායෙන් සහ ගොඩ බෝග වගාවන් තුළින් ග්‍රාමීය ජන ජීවිතයට සහ කෘෂි ආර්ථිකයට උර දීමද වනාන්තරයෙන් ලබාදෙන වාසි සහගත තත්වයකි.

(e) වනවගා ව්‍යාපෘති විස්තරය - නොමැත

(f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන්
- රාජ්‍ය/රාජ්‍ය නොවන/ ස්වේච්ඡා සංවිධාන මඟින්

  Green Jacket පරිසර සංවිධානය

  දියගම ගම තුළ ඇති ගහකොළ, සතා සීපාව ඇතුළු සමස්ථ සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් 2022 වර්ෂයේ දී Green Jacket පරිසර සංවිධානය පිහිටුවා ගන්නා ලදී. මෙම සංවිධානය මධ්‍යම පරිසර අධිකාරියේ රාජ්‍ය නොවන පරිසර සංවිධානයක් ලෙස ලියාපදිංචි කර ඇත.

  මෙම සංවිධානය විසින්

  - දියගම ගම තුළ ඇති සංවේදී පරිසර පද්ධති පිළිබඳව ගම්වාසීන් දැනුවත් කිරීම.

  ගම්වාසීන් තුළ,

  - පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව යහපත් ආකල්ප ඇති කිරීම.
  - ගමට සහ පරිසරයට ආදරය සහ ඇල්ම ඇති කිරීම.
  - පාරිසරික වගකීම් වලින් බැඳුනු ජීවන රටාවකට යොමු කිරීම.

සහ ප්‍රදේශය තුළ සිදුවන පරිසර දූෂණයන් වැළැක්වීම සඳහා සංගමයක් වශයෙන් කටයුතු කිරීම.

යන අරමුණු පෙරදැරිව ගම තුළ විවිධ වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

දියගම, කිරිවත්තුඩුව දහම් පාසල්, පෙර පාසල් හා පාසල් ළමුන් කේන්ද්‍ර කරගනිමින් පාසල් දරුවන් වැඩිහිටියන් ඇතුලු ප්‍රජාව දැනුවත් කිරීම සඳහා දේශන, රුක් රෝපණ වැඩසටහන්, ක්ෂේත්‍ර චාරිකා, ත්‍යාග ප්‍රදානෝත්සව වැනි වැඩසටහන් ඒ අතර වේ.

එසේම පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහභාගි කර ගනිමින් සංවේදී පරිසර පද්ධති පිළිබඳව විවිධ අධ්‍යයන සිදු කරමින් තොරතුරු අනාවරණය කර ගැනීමෙන් facebook, whatsapp ගිණුම් හරහා ඒවායේ ඇති වටිනාකම් පිළිබඳව ලොවට අනාවරණය කිරීමට ද ඔවුන් පියවර ගනිමින් සිටී.

iv. ජෛව විවිධත්වය

(a) ශාක ලේඛනය (විශේෂය වශයෙන්)

දේශීය	ඒකදේශීය	විදේශීය	ස්වභාවිකෘත	ආක්‍රමණශීලි
කදුරු/ කොහුකිරිල්ල / බෙරලිය/ පේර තඹල/ වල්දෙල්/ හීන් කැබැල්ල/ රුක් අත්තන/ නාවල/ බටකිරිල්ල/ වරා/ කුරුලුකදුරු/ බිං කොහොඹ/ ගොඩපර/ පත්තෑල/ගිරිතිල්ල/ රුක්	කටු කිතුල්/ ගොරකා/ වෙසක් මල්/ දුම්මල ශාකය/ ආරිද්ද/ කුරුඳු / කීර ඉද්ද/ දිය හබරල	යුකැලිප්ටස්		ජපන් ජබර / ගඳපාන

(b) ශාක වර්ගීකරණය (දේශීය/ඒකදේශීය/හඳුන්වාදුන් විදේශීය හෝ දේශීය/ස්වභාවිකෘත විදේශීය හෝ දේශීය/ආගන්තුක/ආගන්තුක-ආක්‍රමණශීලි වශයෙන්) (ප්‍රස්තාර සහිතව) කොළඹ විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා අධ්‍යනංශයේ මහාචාර්ය සුධීරා රංවල ඇතුළු කණ්ඩායමක් විසින් කරන ලද අධ්‍යයනයක අනුව දියගම වනාන්තරයට අයත් ශාක වැස්ම තුළ ශාක විශේෂ 96 ක් අතුරින් 12% පමණ ශ්‍රී ලංකාවට ආවේණික ඒක දේශික ශාක වන බවත් 11.7% පමණ වඳවී යාමේ තර්ජනයට ලක්ව රතු දත්ත පොතෙහි ඇතුළත් ශාක බවත් අනාවරණය කරගෙන ඇත. එමෙන්ම පක්ෂි විශේෂ 72 ක් , උරග විශේෂ 33 ක් , උභය ජීවි විශේෂ 07 ක් මිරිදිය මත්ස්‍ය විශේෂ 18 ක් සහ ක්ෂීරපායී විශේෂ 16 ක් යථොක්ත වන පියස වාස භූමිය කරගෙන ඇති බවට ද, මෙකී සත්ව විශේෂ අතුරින් විශේෂ 18 ක් රතු දත්ත පොත අනුව වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ව විශේෂ බවටද හඳුනාගෙන ඇත.

(c) අන්තරායට ලක්වූ කාණ්ඩ (CR/EN/VU-IUCN) (ප්‍රස්තාර සහිතව)

එසේම A.M.U.M. අබේසිංහ විසින් 2023 දී කරන ලද අධ්‍යයනයකට අනුව දියගම ඇලේ මත්ස්‍ය විශේෂ 20 ක් වාර්තා වන අතර ඉන් විශේෂ 4 ක් ජාතික රතු ලැයිස්තුවට අනුව ලංකාවට ආවේණික හා වඳ වී යාමේ තර්ජනයට භාජනය වූ මත්ස්‍ය විශේෂ බව අනාවරණය කරගෙන ඇත.

4. පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

i. කෘෂිකර්මය

(a) ප්‍රධාන භෝග (වී)

පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම් වලින් වී ගොවිතැනට බලපාන ප්‍රධාන බලපෑම් ලෙස වන විනාශය හේතුවෙන් පස දූෂණය හා ජල සම්පත් අඩුවීම. දේශගුණික විපර්යාසයන් මගින් වැව්ලි කාලයන්ට බලපෑම්. රසායනික පොහොර හා කෘමිනාශාක භාවිතයෙන් පසෙහි ගුණාත්මක භාවය අඩුවීම. ජලයේ අමුතුකම් වැඩිවිම. ප්‍රධාන වශයෙන් වී වගාව දියගම පාල කෙත යාය ක්ෂුද්‍ර ජලපෝෂක ප්‍රදේශයකි. හෙක්ටයාර් 28.8 ක් භූමි ප්‍රමාණයක වී වගාව සිදුකරගෙන යන අතර, කුණු කසල බොහෝ විට වෙල්යායට දැමීම හේතුවෙන් පාරිසරික ප්‍රශ්නයක් බවට පත්ව ඇත. බොහෝ විට රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය වී වගාවේ දී සිදුකරනු ලබයි. අද වන විට වී අස්වැන්න ලබාගැනීමේ දී ගොයම් කැපීම මීට පෙර දෑකැති යොදාගනිමින් පිරිස් ඒකරාශි වෙමින් සිදුකරනු ලැබුවද අද වන විට මෙයින් බැහැරව නවීන ක්‍රම වලින් වී අස්වැන්න ලබාගැනීම සිදුකරගෙන යනු ලබයි. බොහෝමයක් වී වගාව සිදුකරනු ලබන්නේ තම නිවෙස්වල පරිභෝජනය සඳහා වේ.

(b) අතිරේක භෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග) - අදාල නොවේ

(c) අපනයන භෝග (තේ/පොල්/රබර්) - රටතුළ පිළිවෙලින් වගා කර විදේශ වෙළඳ පොලට විකුණන කෘෂි බෝග වේ. මෙවැනි බෝග රටේ විදේශ විනිමය ආදායම වැඩිකරන අතර ජනතාවට රැකියා අවස්ථා කාර්මික සම්ප්‍රදාය සහ ආර්ථික වර්ධනය සඳහා මහත් වැදගත් වේ. දියගම නැගෙනහිර වසමේ තේ, පොල්, රබර් දැකගත හැකිවේ.

තේ අක්කර 7 ½ (හෙක්ටයාර් 9.375)

පොල් අක්කර 38 (හෙක්ටයාර් 15.4)

රබර් වගාව අක්කර 11½ (හෙක්ටයාර් 4.45) ඇත.

රබර් වගා කර තිබුණද කිරි කැපීම සඳහා පුද්ගලයන් නොමැති කම ප්‍රධාන ගැටලුවක්ව පවතී.

(d) සුළු අපනයන භෝග /අපනයන කෘෂි බෝග (ඇමුණුම 01) -

බෝග වර්ග - කෝපි, කොකෝවා, පැඟිරි, කරදමුංගු ආදිය සාම්ප්‍රදායික අපනයන බෝග යටතට වැටේ. ගම්මිරිස් , කුරුඳු වසම තුළ දක්නට ලැබෙන අතර කුරුඳු වගාව අලුතින් ආරම්භ කරන ලද්දකි. ගම්මිරිස් හෙක්ටයාර් 2.043ක ප්‍රමාණයක වගා කර ඇත.

(e) වෙනත් වානිජ භෝග (පාම්/අගාවුඩ් ආදිය) - නොමැත

(f) රසායනික පොහොර යෙදවුම (ප්‍රස්තාර සහිතව)

වී වගාව සඳහා රසායනික පොහොර භාවිතය මේ වන විට වැඩිවෙමින් පවතී.



වී වගාව සඳහා ප්‍රධාන වශයෙන් පොහොර වර්ග තුනක් භාවිත කරනු ලබයි. යූරියා, TSP, MOP යනු මේවාය.

පොහොර යෙදීමේ කාල සීමාව	වර්ෂා පෝෂිත (Kg/AC)		
	Urea	TSP	MOP
මූලික	-	22	-
දින 14	10	-	14
දින 28	12	-	18
දින 42	10	-	12
දින 56	8	-	8
එකතුව	40	22	56

කෘෂි නිලධාරි

මේ ආකාරයට පොහොර යෙදීම සිදුකරනු ලබයි.

* තේ වගාව සඳහා වසර 2 ක් යනතුරු T 200 පොහොර භාවිත කරයි. අවුරුදු දෙකෙන් පසු T 750 පොහොර භාවිත කරනු ලබයි.
* APM 3.300 වසරකට යොදනු ලබයි. යූරියා ග්‍රෑම් 800 ක්, එප්පාවල රොක් පොස්පේට් ග්‍රෑම් 900ක්, මියුරේට් පොටෑෂ් ග්‍රෑම් 1600 ක්, ඩොලමයිට් කිලෝ 1 ක් පොල් සඳහා පොහොර යොදනු ලබයි.

(g) කෘමි/පළිබෝධනාශක යෙදවුම (ප්‍රස්තාර සහිතව)



(h) සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

කෘෂි කර්මාන්තය යනු ආහාර, රෙදිපිළි, ඖෂධ හා වෙනත් නිෂ්පාදන සඳහා ශාක හා සත්වයන් වගාකිරීමේ ශිල්ප ක්‍රමයයි. මිනිසාගේ මූලික අවශ්‍යතා සපුරාලන ප්‍රධානතම ක්ෂේත්‍රයක් වේ. පරම්පරාවෙන් ලබාගත් දැනුම හා ක්‍රමවේද භාවිතා කරන ගොවිතැන සාම්ප්‍රදායික ගොවිතැනයි. මේ වන විට වසම තුළ කෘෂිකාර්මික පිළිවෙත් ගිලිහෙමින් පවතී. ගොයම් කැපීමේදී යොදාගන්නා ''අත්තම් ක්‍රමය'' අද වන විට තරමක් දුරට දුරස් වෙමින් තිබේ. ගොයම් කැපීම වැනි විශාල පිරිසක් අවශ්‍ය අවස්ථා සඳහා ගොවීන් පිරිසක් එකතු වී දිනයක එක් ගොවියෙකුගේ ගොවිතැනට ශ්‍රමය සපයයි. පසුව එම ගොවියා අනෙක් ගොවීන්ගේ ගොවිතැනට ශ්‍රමය සපයනු ලබයි. අදවන විට නවීන උපකරණ යොදාගෙන ගොයම් කැපීම සිදුකරනු ලබයි. වී වැපිරීම, අස්වැන්න නිවසට ගැනීම ආදිය සුභ දින සහ සුභ වෙලාවන් යටතේ සිදුකරන ලදී. අද වන විට ඒවා ගිලිහී ගොස් ඇත.

සාම්ප්‍රදායික කෘෂිකර්මය	නවීන කෘෂිකර්මය
අත්තම් ක්‍රමය	නවීන උපකරණ භාවිතය
වී අතින් ඉසීම හා පැළ සිටවීම.	නවීන උපකරණ මගින් වී ඉසීම.
දෑ කැති මගින් ගොයම් නෙළීම	විශාල යන්ත්‍ර සූත්‍ර මගින් ගොයම් කැපීම
අලුත් සහල් මංගල්‍යය	කෙටි කාලයක් තුළ අස්වනු ලබාදෙන බීජ වර්ග හඳුන්වාදීම
සාම්ප්‍රදායික අඳ ක්‍රමය	

හේන් ගොවිතැන වසම තුළ දක්නට නොමැත.

(k) කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා

* කෘෂිකර්මාන්තය කෙරෙහි නැඹුරුවන තරුණ පිරිස අඩුවීම.
* කාලගුණික විපර්යාස නිසා අස්වැන්නට වන බලපෑම
* පොහොර, බීජ හා රසායනික ද්‍රව්‍යවල මිල ඉහල යාම.
* අස්වැන්න අහිමිවීම. (කෘමිරෝග හේතුකොටගෙන)
* වඳුරන් වැනි සතුන් මගින් අස්වනුවලට කෙරෙන විනාශ

ii. පශු සම්පත් කර්මාන්ත

(a) සුලබ පශු කර්මාන්ත යෙදවුම් (ගව/මී ගව/එළු/කුකුළු/වෙනත්)

	ප්‍රමාණය	සත්ව වර්ගය	යොදාගන්නා කාර්ය	හිමිකරුවන්	ඇතිකිරීමේ ක්‍රමය	ආහාර
එළ ගව	3	සහිවාල්		2	නිදැලි	ස්වභාවික (පුන්නක්කු)
කුකුළු	45	ගම් කුකුලන්	බිත්තර	3	නිදැලි	ස්වභාවික හා කෘතිම

(b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තරය (ස්වාභාවික/කෘත්‍රිම/මිශ්‍ර)

(c) පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය)

හරකුන්ගේ කුර ලෙඩ සඳහා ඇතැම්විට බෙහෙත් වර්ග ලබාදී තිබේ.

කුකුලන්ගේ පණුරෝග සඳහා පණු පෙති ආදිය ලබාදේ.

iii. ධීවර කර්මාන්තය

(a) ප්‍රධාන ධීවර අයිතම (මත්ස්‍ය වර්ග)



එසේම A.M.U.M. අබේසිංහ විසින් 2023 දී කරන ලද අධ්‍යයනයකට අනුව දියගම ඇලේ මත්ස්‍ය විශේෂ 20 ක් වාර්තා වන අතර ඉන් විශේෂ 4 ක් ජාතික රතු ලැයිස්තුවට අනුව ලංකාවට ආවේණික හා වඳ වී යාමේ තර්ජනයට භාජනය වූ මත්ස්‍ය විශේෂ බව අනාවරණය කරගෙන ඇත.

(b) ධීවර කාර්මික පරිචාර (සම්ප්‍රදායික බිලිබෑම/දැල් දැමීම/නවීන ක්‍රම ආදිය) - අදාල නොමැත

(c) ධීවර කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා - අදාල නොමැත

iv. ශක්ති ප්‍රභව

(a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය (ප්‍රස්තාර සහිතව)

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව
- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව

* වසම තුළ පුනර්ජීවන ශක්ති ප්‍රභව ලෙස සෝලා පැනල් 2 පමණ සවිකර ඇත.

* පුනර්ජීවන නොවන ශක්ති ප්‍රභව

''පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභවය'' යනු එම ශක්ති ප්‍රභවයන් විශේෂයෙන් කල් පවතින විශාල වාතත හා භූගත සම්පත් මත පදනම් වන්නේය. ඉතා සීමිත මට්ටමින් පවතී.

පුනර්ජනනීය ශක්ති ප්‍රභව ලෙස දියගම නැගෙනහිර වසම තුළ ඩීසල්, පෙට්‍රල්, ගෑස් හා දර භාවිතය සිදුවේ.



(b) ස්වභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය (ප්‍රස්තාර සහිතව)

ඉල්ලුම - ජනගහනය දිනෙන් දින වැඩිවෙනවා මිස අඩුවක් නොමැති මෙසේ වැඩිවන ජනගහණයට අවශ්‍ය වන ශක්ති සම්පත් ද ඉල්ලුම ඉතා සීග්‍රයෙන් වැඩිවේ. විදුලිය/බොරතෙල්/ ගෑස් ආදිය ඉල්ලුම ඉතා ඉහළ වේ. වැඩිවන කර්මාන්ත සඳහා ද ඉල්ලුම ඉහළ වේ.

ජීවන තත්වය පහසු කිරීමට යොදාගන්න නොයෙකුත් දෑ නිසා ද ඉල්ලුම තව තවත් ඉහළ යයි.

(c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය



5. සමාජ-සංස්කෘතික සන්දර්භය

i. පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රණය

දියගම වසමට අදාල පාරිසරික ගැටළු

* පහත්බිම් ගොඩකිරීම.
* ඇල ඉවුරු පාංශුඛාදනය
* කැලි කසල ඇල මාර්ගවලට හා අවට පරිසරටය මුදා හැරීම.
* කෘමිනාශක භාවිතය නිසා ජලය දූෂණය වීම
* වර්ෂා කාලවලදී ගොඩබිම් කැලිකසලට සෝදා යාමෙන් ජලය කුණු කසල ඇල මාර්ගයට එක්වේ.

<u>විසඳුම්</u>

* දියගම සංවේදි පරිසර පද්ධති පිළිබඳව ප්‍රදේශවාසීන් පුලුල්ව දැනුවත් කිරිම.
* Face book, whatsapp ආදි සමාජ ජාලා මගින් දැනුවත් කිරීම.
* ප්‍රදේශය තුළ ඇති පරිසර පද්ධති පිලිබඳව අධ්‍යයනය කිරිම සඳහා විශ්වවිද්‍යාල, පාසල් සිසුන්ට අවස්ථාව සලසා දීම.
* ප්‍රාදේශීය සභාව හා එක්ව අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවේද සැකසීම.
* පෙර පාසල්, දහම් පාසල් හා පාසල් සිසුන්, දෙමව්පියන් දැනුවත් කරන වැඩසටහන් සංවිධානය කිරීම.

ii. සම්ප්‍රදායික පරිසර දැණුම හා පරිචාර

පාරම්පරිකව පැවතෙන කාලගුණික පදනම් වූ දැනුම ද, අවබෝධය ද, සිරිත් විරිත් ද දියගම ග්‍රාමය තුළ ගොඩනැගී ඇත.

(a) ජනප්‍රවාද

වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම

දියගම ගම පිළිබඳ ප්‍රදේශවාසීන් අතර ප්‍රචලිතව පවතින ප්‍රධාන ජනප්‍රවාද දෙකකි.

- මාර්ග පහසුකම් නොමැති කාලයේ ජනයා ඇළ දොළ පාරවල් වලින් එතෙරව තමන්ට අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ස්ථාන වලට ගියෝය. එලෙස යන සෑම විටම වතුරින් එතෙර වී යායුතු විය. මෙම ප්‍රදේශය ජලයෙන් වට වූ ප්‍රදේශයක් වූ බැවින් ද, කිසිදු විටක ජලය හිඟ නොවූ බැවින් ද දිය රැඳි ගම '' දියගම'' නමින් හැඳින්වූ බව.

- අතීතයේදී දැඩි නියං කාලයකදී ප්‍රදේශයේම ජලය සිඳී ඇති අතර වත්මන් ශාලවනෝද්‍යාරාම විහාර භූමියේ කෙළවර ''කහඳවල'' පරිශ්‍රයේ ළිඳක් හාරා එයින් ජලය ප්‍රයෝජනයට ගෙන ඇත. අවට ප්‍රදේශ වලද නියඟය නිසා ජලය නොමැති බැවින් එම ප්‍රදේශවාසීන් ද මෙම ළිඳ වෙත ජලය සොයා පැමිණ ඇති බැවින් දිය ඇති ගම ''දියගම'' ලෙස හැඳින්වූ බව.

(b) දේශීය වෛද්‍ය ක්‍රම

කුරුප්පු අච්චිගේ ඕදිරිස් සර්වාංග හා ගෙඩි වන පිළිකා පිළිබඳ විශේෂඥයෙක් වේ. ගමනාගමන අපහසු කාලයේ දී පවා මිනිසුන් දුනු කරත්ත වලින් මෙම වෙද මහතා සොයා පැමිණ ඇත.

කණ ඇතුලේ තියෙන ගෙඩි මන්ත්‍ර සාස්ත්‍රයෙන් මූණට අරගෙන පලා අයින්කර ඇත.

දරුවන් පිළිසිඳ ගැනීම් වලදී රෝහල් නොමැති නිසා නිවෙස්වල දරුවන් ප්‍රසූත කර ඇත. එහිදී දරුවා හරහට සිට අපහසු වූ අවස්ථාවලදී එම ගෙදරට ගොස් දෙහි ගෙඩි හතක් මතුරාගෙන ගොස් ගෙට ඇතුල්වන දොරේ එළිපත්ත උඩ තබා කපනු ලබයි. එවිට කිසිම කරදරයකින් තොරව දරුවා ප්‍රසූත කර ඇත.

මෙවැනි වටිනා විශිෂ්ට වෙදවරුන් මෙම ගමෙහි ජීවත්ව සිට ඇත.

ඔහු 1900 සිට 1950 ගණන් දක්වා හොඳ සේවයක් කර ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේම ප්‍රසිද්ධ වෙදෙක් ලෙස සිට ඇත.

ලීනිස් නැමැති දක්ෂ හරක් වෙද මහතෙකු ද සිට ඇත. 1925 සිට 1960 දක්වා ජීවත්ව සිට ඇත.

ඇස්වහ, කටවහ මතුරන පිරිස් ද මෙම ගම්මානයේ ජීවත්ව සිට ඇත.

විෂ ශාස්ත්‍රය පිළිබඳව දැනුම ඇති පිරිස් ද ගම්මානයේ වාසය කර තිබේ.

iii. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය - අදාල නොමැත

iv. පරිසර ගැටළු සඳහා යෙදුණු විසඳුම්/විකල්ප

1. කාබනික /ගොම පොහොර භාවිත කරතිබේ.
2. සරල ජිවන රටාවකට පුරුදු වූ ජනතාවක් සිට ඇත.

6. කාලීන පාරිසරික අර්බුද හා අභියෝග

i. වන විනාශය /කැළෑ එළිකිරීම

දියගම බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් අක්කර 15ක් පමණ වන දියගම වනාන්තරය ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් ඉදිකිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුදුරු අනාගතයේදී එළි කිරීම නිසා සිදුවන වන විනාශය.

දියගම ඇල ඉවුර විවිධ මානව ක්‍රියාකාරකම් නිසා දියලම ඇල ඉවුරේ ඇති ශාක වැස්ම ඉවත් කිරීම.

ii. ජල හිඟය

- ප්‍රදේශවාසීන් හට කසල බැහැර කිරීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දියගම ඇලට හා ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශයට කුණු කසල දැමීම.
- වගා කටයුතු සඳහා මහා පරිමාණයෙන් රසායනික පොහොර යෙදීම.

වැනි කරුණු නිසා ප්‍රදේශයේ ජලය දූෂණය වීම මඟින් ජල හිඟයක් මතු වී තිබීම.

iii. පාංශු හායනය

- කෘෂි කර්මාන්තය සඳහා මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා පස් තට්ටුවට හානි සිදුවීම.
- ගංවතුර ආපදාව නිසා සිදුවන සෝදා පාලුව
- කෘෂිකර්මාන්තය සඳහා මහා පරිමාණ රසායනික පොහොර යෙදීම.

iv. කැලි-කසල බැහැරකිරීම

ගම්වාසීන් තුළ ඇති නොදැනුවත්බව සහ නොසැලිකිලිමත් බව නිසා පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සංවේදි පරිසර පද්ධති විනාශ වීම.

v. දේශගුණික විපර්යාසවල බලපෑම

අධික උෂ්ණත්වය සහ අධික වර්ෂාව නිසා වගා පාලුවීම, පස නිසරු වීම ජෛව විවිධත්වයට හානි සිදුවීම.

අද වන විට දියගම ගම විශාල පාරිසරික අර්බුද හා අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී.

දියගම අතීතයේ දී බ්‍රාහ්මණගම විසූ බ්‍රාහ්මණයන් යාග හෝම පැවැත්වූ ස්ථානය හෝමාගම වූ බවත් ඔවුන්ට දියගෙන ගිය ගම දියගම වූ බවත් කිරි රැගෙන ගිය ගම කිරිවත්තුඩුව වූ බවත් ජනප්‍රවාදයේ පවතී.

ගොවිතැන ප්‍රධාන ජීවිකාව කරගත් කුල පරම්පරා කිහිපයක ට අයත් පවුල් කිහිපයක් මේ ගමේ වාසය කර ඇත. කුරුප්පු ආරච්චි, ආරච්චි, සහ වීරසූරිය ඒ අතර වෙයි. ඔවුන්

පන්සල ඇසුරු කර ගනිමින් සාම්ප්‍රදායික සරල දිවිපෙවෙතක් ගත කර ඇත. මොවුන් සාමූහික සාමකාමී පිරිසක් වීම තුළින් පාරිසරික අභියෝගවලට සාර්ථකව මුහුණ දී ඇත. වී ගොවි තැන ප්‍රධාන වශයෙන් සිදුකර ඇත. සෑම නිවසකම කිරි ගවයන් සිටි අතර කිරි නිශ්පාදන සහ පොහොර ලබාගැනීමට මෙය මහත් රුකුලක් වී තිබූ බව පෙනී යයි.

වී ගොවිතැන හා බැඳුනු වත් පිළිවෙත් තිබී ඇත. යල සහ මහ කන්න දෙකම වගා කෙරුණු අතර සෑම කන්නයකම සෑම යායකම එකවර ගොවිතැන් කිරීම ඇරඹීම හා එකම වර්ගයක වී වගා කිරීම තුළින් කෘමි උවදුරු අවම කර ගැනීමටත් කල් යල් බලා ගොවිතැන් කිරීම මගින් කාලගුණික විපර්යාස නිසා ඇතිවන වගා හානි අවම කර ගැනීම හා සාර්ථක වී අස්වැන්නක් ලබා ගැනීමට හැකි විය. සෑම කුඹුරු යායකම කෙළවර කුරුල්ලන් හට කුඹුරු ලියැද්ද නම් ලියැද්දක් වෙන්කර තිබීම තුළින් කුරුල්ලන් කුඹුරට ගෙන්වා ගැනීම නිසා කෘමි උවදුරු පාලනය කර ගැනීමට පරිසර හිතකාමී ක්‍රම යොදාගෙන තිබිණි. එසේම කයියට කුඹුරු ගොවිතැන් කිරීම නිසා ගොවිතැනට අවශ්‍ය ශ්‍රමය පහසුවෙන් සපයා ගත හැකි වීම සහ ගම්මුන් අතර සාමූහික බවද ගොඩනැගී ඇත.

වී අස්වනු නෙලා පාගා ගෙට ගත් අවසන වී ඇප ගැලවීමේ ශාන්ති කර්මය ඉටු කිරීම සඳහා අලුත් සහල් වීදියගොඩ දේවාලයට ගෙනගොස් දෙනු ලබයි. අනතුරුව සෑම වසරක් පාසාම ගම්මඩු ශාන්ති කර්මය පවත්වා ඇත. වී ගොවිතැන ට අමතරව තේ, රබර්, පොල්, කුරුඳු, බුලත් සහ එළවළු බෝග වගා කර ඇත.

සෑම පවුලකම ලොකු කුඩා සෑම අයෙක් ම නිශ්පාදන කෘෂිකර්මාන්තයෙහි නියැලි සිට ඇති අතර, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීමට සතිපතා ඉරිදා පොළ ක්‍රියාත්මක වී තිබී ඇත. සෑම ඉරිදාම රාත්‍රියේ පැවැත්වෙන මේ පොළට විවිධ ප්‍රදේශ වල සිට පැමිණෙන තොග වෙළඳුන් හට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමට එදා ගැමියන්ට අවස්ථාව සැලසිණි. පන් ආශ්‍රිත නිෂ්පාදන, කිතුල් හකුරු, කිතුල් පැණි, පොල් හකුරු, පොල් පැණි, කුරුඳු, බුලත්, පුවක්, එළවළු, පළතුරු, පලා වර්ග , බිත්තර ආදී සියළු නිෂ්පාදන අලෙවි කිරීමට එදා ගැමියන් මේ පොළට රැගෙන එන අතර මේවා අලෙවිය තුළින් ඔවුන්ගේ අත මිට නිතරම සරු විය.

එසේම දියගම විහාරස්ථානයේ සියලු ඉදිකිරීම් ඇතුළු වස් පිංකම්, පිරිත් පිංකම්, සල්පිල්, පෙරහැර වැනි සියළු කටයුතු ඉටු කෙරුණේ එදා ගැමියන් සංවිධානය වීම තුළිණි.

එදා ගැමියන්ගේ සියළු කටයුතු සඳහා අවවාද අනුශාසනා ලබාගත්තේ විහාරාධිපති ස්වාමීන්වහන්සේලාගෙනි. එසේම ගැමියන් අතර ප්‍රචලිත යන්ත්‍ර මන්ත්‍ර ශාස්ත්‍ර දත් පිරිසක් මෙන්ම හෙළ වෙදකම් කළ දක්ෂ සිංහල වෙදුන් ද සිට ඇත.

එදා ගැමියන් පාරිසරික අභියෝග ජය ගත්තේ සාමූහිකව පරිසර හිතකාමී වැයම තුළින් වූවත් 1960 දශකයේ මැද භාගයේ සිට මේ තත්වය ක්‍රමයෙන් වෙනස් වෙමින් අද වන විට ඉතා භයානක අන්දමින් පාරිසරික අර්බුද හා අභියෝග මතුවෙමින් පවතී.

vi. ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලි විශේෂවල බලපෑම - අදාල නොවේ.

7. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කරගැනීම (ඇමුණුම 02)

i. අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

පිරිසිදු පානීය ජලය යනු රෝගකාරක ජීවීන් රසායනික ද්‍රව්‍ය හෝ භෞතික දූෂණයකින් තොරව මිනිසුන්ට ආරක්ෂිතව පානය කළ හැකි ජලයයි.

සනීපාරක්ෂාව යනු මිනිසුන්ගේ සෞඛ්‍යයට හානිකර නොවන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මානව අපද්‍රව්‍ය නිසි ලෙස ඉත් කිරිම හා පාලනය කිරීමයි. මෙම දෙකම මානව සෞඛ්‍යයට හා සමාජයේ සුභසාධනයට අත්‍යවශ්‍ය වේ.

විසඳුම් හා අභිමතාර්ථ

- මිනිසුන්ට පානය කිරීම, පිසීම හා පෞරුෂත්වය පවත්වා ගැනීම සඳහා අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය හා රෝගකාරක ජීවීන්ගෙන් තොර, ආරක්ෂිත ජලය ලබාගත හැකිවීම.
- මිනිස් මලමුත්‍ර සුරක්ෂිත ලෙස ඉවත් කිරීම, ජලය දූෂණය වීම වැළැක්වීම සහ පරිසරය ශුද්ධ පවිත්‍රව ස්ථිරව පවත්වා ගැනීමේ ක්‍රමවේද
- ජලය හේතුවෙන් ව්‍යාපත්වන රෝග අඩුකිරීම, සමාජ සෞඛ්‍ය තත්වය හා ජීවන තත්වය ඉහළ නැංවීම, සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය.
- වසම තුළ සනීපාරක්ෂක පහසුකම් හොඳ මට්ටමක පවතින අතර නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති පිරිපහදු කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය හා ප්‍රතිචක්‍රීයකරණය ප්‍රජා අධ්‍යාපන හා සනීපාරක්ෂක චර්යා ප්‍රවර්ධනය.
- දියගම වසම තුළ දියගම පාසල, සේවාපියස, මාතෘ සායන, ව්‍යාපාරික ස්ථාන, නිවාස යන සියලුම ස්ථානවල මුළුතැන්ගෙයි, වැසිකිළි පද්ධති අවට පරිසරය ඇතුළුව නිසි අපද්‍රව්‍ය කළමණාකරණ පද්ධතියක් සෑම ආයතනයකම ස්ථාපිතව තිබීම අවශ්‍ය වේ. නිරෝගිමත් පරපුරක්, සතුටින් පිරුණු පවුලක්, හොඳ ශ්‍රම බලකායක් ශක්තිමත් පුරවැසියෙක් නිර්මාණය වනු ඇත.

ii. අභිමතාර්ථ අංක 07 - ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

- ධරණීය බලශක්තිය

  වසමේ ධරණීය බලශක්ති ප්‍රභවයක් ලෙස සෝලා පැනල් නිෂ්පාදනය පමණක් පවතී. දිගුකාලීනව මෙය පවත්වා ගත හැක. මෙයින් පරිසරයට හානියක් නොමැත.
- සුනිත්‍ය බලශක්ති

  බලශක්තිය අපතේ යාමකින් තොරව අවම ප්‍රමාණයක් යොදවා යම් කාර්යයක් සිදුකිරීම බලශක්ති කාර්යක්ෂමතාවය මගින් ලැබෙන ප්‍රතිලාභ රැසකි. බලශක්ති කාර්යක්ෂමතාවය මගින් ගෘහාශ්‍රිත වියදම් අවම වන්නා සේම එය සමස්ත අර්ථිකය කෙරෙහි ඉතා යහපත් බලපෑම් ඇති කරයි.

- මෙය පරිසරයට හිතකාමී ක්‍රමවේදයකි.
- ශක්ති වියදම් අඩුවේ
- පිරිවැය අඩුවේ

  ධරණීය ශක්තිය හා සුනිත්‍ය ශක්තිය දෙකම එකට ගත්විට තිරසාර සංවර්ධනයක් ඇති කරගත හැකිවේ. බලශක්ති කාර්යක්ෂමතාව මගින් ප්‍රතිලාභ රැසක් අත්පත් කරගත හැකිවේ.

iii. අභිමතාර්ථ අංක 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටාවන් යනු පාරිසරිකව යුක්තිසහගත හා තිරසාර ක්‍රමවේද අනුගමනය කරන ආර්ථික ක්‍රියාවලියකි. මෙහිදී ස්වභාවික සම්පත් ඵලදායීව භාවිතා කරමින් අපද්‍රව්‍යයන් අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය සහ පාරිසරික හානි අවම කිරීම මූලික අරමුණ වේ.

1. ස්වභාවික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම.
2. පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම.
3. පරිභෝජනයේ දී අපවිත්‍රකරණය අඩු කිරීම.
4. නැවත භාවිතය.
   ප්‍රතිචක්‍රීකරණය සහ අලුත්කිරීම ඉහළ නැංවීම.
5. දිගුකාලීන පාරිසරික සුරැකුම්පත් සහතික කර ගැනීම.
6. සමාජයට සහ ආර්ථිකයට තිරසාර ලාභ ලබාදීම.
   මෙමගින් වර්තමාන සහ අනාගත පරපුර සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සහතික කෙරේ.

iv. අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

දිගුකාලීනව පෘථිවි පෘෂ්ඨයේ යම් ප්‍රදේශයක දේශගුණයේ සිදුවන ස්ථාවර වෙනස්කම් සහ අසමානතා තත්වයන් ය.

මෙයට උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං රටා වැනි දේශගුණික සාධකවල දීර්ඝකාලීන වෙනස්කම් ඇතුළත් වේ. මෙම විපර්යාස ස්වභාවික හෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැක.

වගාවන්ට සිදුවන හානිය මේනිසා අති විශාලය.

වගාවන් සිටවනු ලබන කාලයේ සිට අස්වනු නෙලන කාලයේ දී සිදුවන අනපේක්ෂිත කාලගුණික විපර්යාස. එනම් අධික වර්ෂාව හා වියළි කාලගුණය.

- ප්‍රධාන බලපෑම්
  * උෂ්ණත්වය ඉහළ යාම
  * කාලගුණික අසමානතා
  * මුහුදු මට්ටම ඉහළයාම හා ගංවතුර
  * කෘෂිකර්මාන්තයට හානි
  * ජෛව විවිධත්වය අඩුවීම

* මානව සෞඛ්‍ය ගැටළු
* ජල හිඟය
* ආහාර දාමය බිඳ වැටීම

මෙමඟින් පරිසර පද්ධති ආර්ථිකය හා සමාජය පුළුල් ලෙස බලපායි.

v. අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව - අදාල නැත.

vi. අභිමතාර්ථ අංක 15 - භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසාර භාවිතාව

භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය යනු වනාන්තර, මුහුදු තීර, වෙරළබඩ, තෙත් බිම් වැනි විවිධ පරිසර පද්ධති ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියයි. තිරසාර භාවිතය යනු මෙම පද්ධතිවල සම්පත් අනාගත පරපුර සඳහා සුරක්ෂිතව තබමින් වර්තමාන අවශ්‍යතා සපුරාලීමයි. මෙයට පාරිසරික සමතුලිතතාව නොබිඳිමින් සම්පත් භාවිතය, ප්‍රදේශ සංරක්ෂණය, ජෛව විවිධත්වය පවත්වාගැනීම සහ පාරිසරික අවදානම් කළමනාකරණය ඇතුළත් වේ.

- දියගම බටහිර වසමට අයත් දියගම වනාන්තරය ආරක්ෂා කරගැනීම මෙහිදී ප්‍රධානකොට දැක්විය හැක.
- අත්‍යවශ්‍ය අපද්‍රව්‍ය ඉවත් කිරීම.
- අනවශ්‍ය ඉදිකිරීම් සිදුකිරීම නවතාලීම.
- ස්වදේශික ශාක හා සත්ව විශේෂ සංරක්ෂණය කිරීම.
- වනාන්තර සංරක්ෂණය කිරීම.
- ස්වභාවික වාසස්ථාන ආරක්ෂා කිරීම.

<u>තිරසර භාවිතයේ දී</u>

- වන වගා ක්‍රම
- අලංකාර ශාක වගාව
- ජල සම්පත් කළමණාකරය
- පරිසර සංචාරක ක්‍රියාකාරකම් ඇතිකිරීම.

මෙමගින් ස්වදේශික සංස්කෘතියට ගරු කිරීම සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ට ආර්ථික ප්‍රතිලාභ ලබාදීම ඇතුළත් වේ.

8. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්,යෝජනා හා නිර්දේශ

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සංවේදි පරිසර පද්ධති හඳුනාගැනීම සඳහා සුදුසු ක්‍රමවේද හඳුනාගනිමින් ඒවා ක්‍රියාත්මක කිරීම.

1. ප්‍රදේශයේ පාසැල් ළමුන්, ප්‍රදේශවාසීන්, රාජ්‍ය නිලධාරීන් ඒ පිළිබඳව පෙළඹවීම.
2. එසේ හඳුනාගත් පරිසර පද්ධති පිළිබඳව ඒ ඒ ප්‍රදේශවල පාසැල් ළමුන්, වැඩිහිටියන් සහ සියළුම රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.
   (දේශන/ වැඩමුළු / වෙබ් අඩවි) ප්‍රා.ලේ. මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
3. සංවේදි පරිසර පද්ධති පිළිබඳ අධ්‍යයනයෙහි යෙදෙන, සොයාගැනීම් කරන, පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පෙළ ගැසෙන, ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන පුද්ගලයන්, පිරිස්, කණ්ඩායම් ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ඇගයීමකට ලක් කිරීම. (හරිත සම්මාන / ත්‍යාග ප්‍රදානෝත්සව) ක්‍රියාත්මක කිරීම.
4. ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ඇති සංවේදි පරිසර පද්ධති පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වෙබ් අඩවි/ෆේස් බුක්/ ප්‍රදර්ශන/ පුවත්පත් යොදාගනිමින් දැනුවත් කිරීම.
5. ප්‍රාදේශීය සභාව සමග කැලි කසල බැහැර කිරීම් සම්බන්ධව එක්ව සුදුසු වැඩ සටහන් හඳුන්වා දීම.
6. ඒ ඒ ප්‍රදේශවල ඇති සම්පත් උපයෝගී කරගනිමින් කළ හැකි දේශීය කර්මාන්ත පිළිබඳව සොයා බලා ගම්වාසීන්ට අවශ්‍ය පුහුණුව / මග පෙන්වීම / ආධාර සහ වෙළඳපල හඳුන්වාදීම. (කුරුඳු/කිතුල්/පොල්/පන්) ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රදේශවාසීන් සවිබල ගැන්වීම.
7. අතීතයේ පැවැති ඉරිදාපොළ නැවත ක්‍රියාත්මක කිරීම, ගම්වැසි සියළුදෙනාගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා තොග පොළ නැවතත් ක්‍රියා

9. ඇමුණුම්

i. සම්පත් සිතියම



ii. රූප සටහන් /කටු සටහන්/චිත්‍ර

iii. ප්‍රජා සහභාගීත්ව පර්යේෂණ/සමීක්ෂණ

10. විමර්ශන

11. වසම පිළිබඳ